සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 08 - 2023

## ඉස්ලාම්

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ඉතා සුදුසු පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. ''නියත වශයෙන්ම දේව ගැත්තන්ගෙන් ඔහුට බයවන්නන් උගතුන්ය'' යනු
 i. නබි වදනක් ii. අල්කුර්ආනයේ වදනක් iii. සහාබි වදනක් iv. ඉමාම්වරුන් ගේ වදනක්
02. ළමයින් සමග ක්‍රීඩා කරමින් සිටි ළමයෙක්ව උස්සමින් ''මොහු නබි (සල්) තුමානන්හට රූපයෙන් ඉතා සමානයි'' යනුවෙන් අබූබක්කර් (රලි) තුමා පැවසූහ.එම ළමයා කව්රුන්ද?
 i. හසන් (රලි) ii. හුසෙයින් (රලි) iii. සෙයිද් (රලි) iv. උසාමා (රලි)
03. අල්ලාහ් තමා යහපතක් ලබා දෙන්නන්ට කැමතිවන යහපත කුමක්ද?
 i. සම්පත් ii. ශරීර සුවය iii. දැනුම iv. සිත සැනසුම
04. වැකි හතකින් යුත් සූරා මාඌන් අල්කුරානයේ
 i. 96 වැනි පරිච්ඡේදය ii. 97 වැනි පරිච්ඡේදය iii. 107 වැනි පරිච්ඡේදය iv. 108 වැනි පරිච්ඡේදය
05. අවසන් දේව කෘතිය පහළවූ මාසය හඳුන්වන්නේ
 i. ෂහ්රු දුල් හිජ්ජා ii. ෂහ්රු රමලාන් iii. ෂහ්රු ෂව්වාල් iv. ෂහ්රු සෆර්
06. රාමලාන් මාසයේ අවසන් දින දහය පල්ලියේ රැඳී සිටිමින් ඉටුකරන යහ ක්‍රියාව කුමක්ද?
 i. ඉඃතිකාෆ් ii. හිස්බුල් කුර්ආන් iii. කියාමුල්ලෛල් iv. තහජ්ජත් සලාතය
07. ඉස්ලාමීය ආර්ථිකයේ ජීවය ලෙස හැඳින්වෙන්නේ
 i. සදකා ii. සකාත් iii. හදිය්‍යා iv. හිබා
08. අල්ලාහ් කමා කරන හාදයාවන්ත කෙනා යනුවෙන් හැඳින්වෙන නම්
 i. අල් කෆූර් අල් රහීම් ii. අල් වදූද් අල් අසීස් iii. අල් කරීම් අල් රහීම් iv. අර්රහ්මාන් අර්රහීම්
09. සකාත් ලැබීමට හිමිකම් ඇති පිරිස ලෙස අල්කුර්ආනය සඳහන් කාණ්ඩ සංඛ්‍යාව
 i. 8 ii. 10 iii. 7 iv. 11
10. සදාකල් පාප ක්‍රියාන්වල යෙදුනු නිසා ඉතිහාසයේ විනාශ කරන ලද කණ්ඩායම වනුයේ
 i. අවුස් කස්රජ් ii. ආද් සමූද් iii. කුරෛෂිවරුන් හා මදනිවරුන් iv. කුරෛෂිවරුන් හා අබ්රහා

- ''අ'' කොටසේ සඳහන් කරුණු අතරින් සුදුසු වචන ''ආ'' කොටසින් තෝරා ගලපන්න.

| | ''අ'' කොටස | | ''ආ'' කොටස |
|---|---|---|---|
| 11. | සූරා අල් කහ්ෆ් | **A.** | තර්තීබුත් තිලාවත් |
| 12. | රාත්‍රිය පුරා නැමදුම් කිරීම | **B.** | කියාමුල් ලෛල් |
| 13. | අල්කුර්ආනය සරලව කියවීම | **C.** | සිකුරාදා |
| 14. | සලාතුල් ඉස්තිහාරා | **D.** | යහගුණය |
| 15 | හුලුකුන් අලීම් | **E.** | උපකාර පතා නැමදීම |

- පහත සඳහන් ප්‍රශ්ණවලට අදාල වචන තෝරා හිස්තැන් පුරවන්න.

16 තව්හීද්, රිසාලත් ......................................... යනු ඉස්ලාමීය මූලික විශ්වාස වේ.
17 සම්පූර්ණයෙන්ම ආරක්ෂා කරන ලද කෘතිය ......................................... වේ.
18 ......................................... ස්වර්ගයේ යතුර වේ.
19. හීබ්රු භාෂාවෙන් පහලවූ දේව කෘතිය ......................................... වේ.
20 උලුල් අස්ම් යනු ......................................... අර්ථය වේ. (ලකුණු 20x2 =40)

## II කොටස

- **පහත සඳහන් ප්‍රශ්නවලින් ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

**1.**

01. කුඩා ළමයින් වැඩිහිටියන්ගෙන් බලාපොරොත්තුවන කරුණු තුනක් සඳහන් කරන්න.
02. නබි (සල්) තුමාණන් කුඩා ළමයින් කෙරෙහි ආදරය කළ අවස්ථා තුනක් සඳහන් කරන්න.
03. නබි (සල්) තුමාණන් කුඩා අබු හජ්ස් (රලි) තුමාණන්හට ආහාර ගන්නාවිට අනුගමනය කල යුතුයි පෙන්වාදුන් උපදෙස් සඳහන් කරන්න.

**2.**

01. ''ආලිම්වරුන්'' ලෙස හැඳින්වෙන්නේ කවුරුන්ද?
02. ඉතිහාසයේ පාලකයින් විසින් සිරගත කරනු ලැබූ ආලිම්වරුන් තිදෙනෙක් නම් කරන්න.
03. ආලිම්වරුන්ට ගෞරවය කල යුතු ආදර්ශමත් ක්‍රම හතරක් සඳහන් කරන්න.

**3.**

01. ''සජදා සුක්ර්'' යනු කුමක්ද?
02. සජදා සහ්වු ඉටුකරන ලබන අවස්ථා දෙකක් සඳහන් කරන්න.
03. ''සුජූදු'' ඉටු කිරීම පිළිබඳ අල්කුර්ආන් වැකියක් හෝ හදීසයක් සඳහන් කරන්න.

**4.**

01. යහපත් ක්‍රියා හා අයහපත් ක්‍රියා මිනිස් සිත්තුල ඇති කරන්නාවූ හැඟීම් සඳහන් කරන්න.
02. අවසන් දිනයේ ප්‍රශ්න කරනවිට කැඳවන ලබන සාක්ෂීන් කුමක්ද?
03. හදීසයේ සඳහන් මහා පාප ක්‍රියාවන් ලෙසින් හැඳින්වෙන මහා පාප තුනක් සඳහන් කරන්න.

**5.**

01. විශ්වාසවන්ත බව හැසිරීමෙන් පෙන්නුම් කෙරෙන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
02. මුහම්මද් (සල්) තුමාණන් ''අල් අමීන්'' ''අස්සාදික්'' යනුවෙන් හැඳින්වීමට හේතුන් දෙකක් සඳහන් කරන්න.
03. වංචා කිරීමෙන් වැලකිය යුතුයි යනුව පිළිබඳ ඉතිහාස ගත සිදුවීමක් සඳහන් කරන්න.

**6.**

01. ජීවිතයේ වැලකී සිටිය යුතු දුර්ගුණාංග හතරක් නම් කරන්න.
02. දුර්ගුණාංගවලින් ඇතිවිය හැකි හානීන් හතරක් සඳහන් කරන්න.
03. නබි (සල්) තුමාණන්ගේ යහ ගුණාංග පිළිබඳව අර්කුර්ආනය වර්ණනා කරන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

**7.** ගමනක් යනවිට පිළිපැදිය යුතුයි ඉස්ලාමය පවසන සාරධර්ම විස්තර කරන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවProvincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 08 - 2023

## ඉස්ලාම්

## පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | 1 | 06. | 1 | 11. | සිකුරාදා දිනය | 16. | මආද් |
| 02. | 1 | 07. | 2 | 12. | කි..මුල් ලෛල් | 17. | අල්කුර්ආනය |
| 03. | 3 | 08. | 1 | 13. | තර්තීබුත් තිලාවත්, තජ්ජිද් | 18. | සලාතය |
| 04. | 2 | 09. | 1 | 14. | උපකාර පතා ඉටුකරන සලාත | 19. | තව්රාත් |
| 05. | 2 | 10. | 2 | 15. | වැදගත් ගති ගුණාංග | 20. | දැඩි අධිෂ්ඨාන තැබූ අය |

### II කොටස

01.
1. ආදරය, උණුසුම, ආරක්ෂාව
2. සලාම් කියයි/ප්‍රාර්ථනා කරයි/වාහනයක රැගෙන යාවි/ හිසේ අත .....
3. අල්ලාහ්ගේ නාමය උසුලා ආහාර අනුභව කරන්න.
   දකුණු අතින් ආහාර ගන්න.
   ඔබට අසලින් තිබෙන ආහාර අනුභව කරන්න.

02.
1. ධර්මානු විද්වතුන් නබි (සල්) තුමාණන් තමන්ගේ සහාබාවරුන් උගන්වූ දෑ ඔවුන්ගෙන් කෙනෙක් තව කෙනෙකු ගෙන් ඉගෙන ගත් අය
2. අබු හනීෆා (රහ්) / අහ්මද් ඉබ්නු හන්බල්......... සිරද් ඉබ්නු සුබෙයිර් (රහ්)
3. ගෞරවාන්විතව බැලිය යුතුය. උපදෙස්වලට සවන්දිය යුතුය.
   අනවශ්‍ය තර්ක විතර්කවල නොයෙදීම. ඒ අයගේ උපදෙස් ලබා ගත යුතුයි.

03.
1. ස්තුතිය අගය කරන සජදාව
2. සලාතයේ අබ්ආලු සුන්නාවලින් එකක් පැහැර හැරීම සලාතය බල රහිත කරන ක්‍රියාවක් අමතක වී කිරීම
3. "විශ්වාසවන්තයිනි" ඔබ නැමී, හිස නමා සුජුද් කර ඔබගේ දෙවියන් හට වඳින්න." (අල්කුර්ආනය)

04.
1. යහපත් ක්‍රියාවක් - ජීවිතය තෘප්තිමත්ව සතුටින් ගෙවී යයි.
   අයහපත් ක්‍රියාවක් - අයහපත් මාර්ගයන් මිනිසාට යහපත් ලෙස පෙන්වා දෙයි.
2. ශරීර අංග / පාප ක්‍රියා සිදුවූ ස්ථානය මලාක්වරුන්ගේ සටහන්
3. අල්ලාහ්ට ආදේශ කිරීම / හූනියම් / ඝාතනය කිරීම / පොලිය

05.
1. සත්‍යවාදී බව, පොරොන්දු කඩ නොකිරීම,
2. නබි (සල්) තුමාණන් බොරු නොකියා සත්‍ය ප්‍රකාශ කිරීම
   නබි (සල්) තුමාණන් විශ්වාසවන්තව හැසිරීම
3. මහජන පොළේ තිබූ ආහාර ධාන්‍ය ගොඩක් පිළිබඳ සිදුවීම

06.
1. බොරුකීම, ආඩම්බර වීම, ඊර්ෂ්‍යාව, කේලම් කීම
2. සිත් සැනසුමක් නොමැතිව සෑහීමට පත් නොවීම යහපත් ක්‍රියා පිළිබඳ වෛරය
   පාප ක්‍රියාවන්ට සිත් යෙදීම නපුරු මිනිසුන් සමඟ සම්බන්ධතා වැඩිවීම.
3. "නබිතුමාණනි, නිසැක වශයෙන් ම ඉතා යහපත් ගතිගුණාංග වලින් පෙළෙන්නේ ය." අල්කුර්ආනය

07.
1. කෙටි . සම්බන්ධ කර නැමදීම
2. පිරිසිදු චේතනා / අල්ලාහ්ගෙන් උපකාර පැතීම / උපදෙස් ලබාගැනීම / ණය ගෙවා යෑම